**ජාතික ළමා සංවර්ධන අරමුදල**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ළමා සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් සඳහා වූ මුළු පොළී ආදායම රු.516,827ක් වුවත් එය රු.447,313ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් පොළී ආදායම රු.69,514ක් අඩුවෙන් දක්වා තිබුණි. ලෙජරයේ ස්ථාවර තැන්පත් පොළී ආදායම් ගිණුමද ක්‍රමානුකලව පවත්වා ගෙන ගොස් නොතිබුණි

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහය 11.1 ඡේදය | අවම වශයෙන් මසකට වතාවක් අරමුදලේ අන්තර් අමාත්‍යාංශ අධීක්ෂණ කමිටුව රැස්වී ආධාර ලැබීමට සුදුසුකම් ඇති ළමුන්ගෙන් ලැබී තිබූ ඉල්ලුම්පත්‍ර සලකා බැලිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එම කමිටුව එක් වතාවක් පමණක් රැස්වී තිබුණු අතර ළමා සංවර්ධන අරමුදල් පනත සම්මත වීමෙන් පසුව වර්ෂය තුළදී ලැබී තිබුණු ඉල්ලුම්පත් 153ක් |

| | |
|---|---|
| | පිළිබඳව සලකා බැලීමට එහිදී තීරණය කර තිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.4 (ආ) ඡේදය | 2010 හා 2011 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශනවලට අදාලව විගණකාධිපතිවරයාගේ වාර්තා සහ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගණුම් වර්ෂය අවසන් වී මාස 05ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ඇ) 2007 මාර්තු 23 දිනැති අංක පීඑෆ/එෆ්එස්/අරමුදල්/එම්ඊ/ 225/05 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | ලිපියේ දී තිබූ උපදෙස් ප්‍රකාර අරමුදල පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කර නොතිබුණි.<br><br>" ජාතික ළමා සංවර්ධන අරමුදල වෙනුවෙන් කෙටුම්පත් පනතක් සකස් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉල්ලීමක් කර තිබුණු අතර එම ඉල්ලීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අහෝසි වී ඇති බැවින් නව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී තිබුණි. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා වන භාරකාර අරමුදලද මෙම අමාත්‍යාංශය යටතේම පවතින බැවින් මෙම අරමුදල් දෙක සඳහාම එක් ඒකාබද්ධ අරමුදලක් පිහිටුවීමට සුදුසු පනතක් සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් යෝජනාකර ඇත. ඒ සඳහා අමාත්‍යවරයාගේ අත්සනින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇතත්, පාර්ලිමේන්තු අනුමැතිය ලැබී නොමැති නිසා අරමුදල් දෙක ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. ඉදිරියේ දී ළමා සංවර්ධන අරමුදල වෙනම අරමුදලක් ලෙස නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු සිදු කරනු |

ඇති බැව් ලේකම්වරයා විසින් මා වෙත වාර්තා කර ඇත. "

**1.2.3 <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙණු</u>**

2009 අගෝස්තු 14 දින සිට වාර්ෂිකව කල් පිරෙන ලෙස රු.මිලියන 02ක වටිනාකම ඇති ස්ථාවර තැන්පත් ආරම්භ කිරීම සඳහා අන්තර් අමාත්‍යාංශ අනු කමිටු අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**2. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.244,244ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකත් වර්ෂයේ රු.600,122ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.844,366ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂය තුලදී පොත් ආදායම හා වෙනත් ආදායම් පිළිවෙලින් රු.67,840කින් හා රු.713,360කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**3.1 <u>කාර්ය සාධනය</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මාර්තු 01 දිනට පැවති විශ්ව ළමා දිනය වෙනුවෙන් නිකුතු කොඩි අළෙවියෙන් පසු මුදල් එකතු කර ගැනම සම්බන්ධයෙන් පැවති අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ පහත අඩුපාඩු විය.

I. කොඩි අළෙවියෙන් ලද මුදල්, අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කිරීම සෘජුවම බැංකු ගිණුමට හෝ අමාත්‍යාංශය වෙත එවීම යන ක්‍රමවේද දෙකක් පැවතුණි.

II. බැංකුව වෙත සෘජුවම එවන ලද මුදල් හදුනා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොතිබුණි.

III. කොඩියක නිශ්චිත මිලක් නියම නොවීම මත කොඩි අලෙවියෙන් එකතු වන සම්පූර්ණ මුදල කොපමණද යන්න තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණි.

**(ආ)** ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4(5) ජේදය ප්‍රකාරව ඉලක්කගත අරමුදලේ ප්‍රමාණය 2008 දෙසැම්බර් වනවිට රු.මිලියන 50ක් දක්වා වැඩි කිරම අරමුණ වී තිබුණත්, 2012 දෙසැම්බර් 31 දිනට අරමදලේ වටිනාකම රු. 6,152,422ක් පමණක් වී තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම**

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරච්ජේදයට අදාලව පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම අරමුදලේ අරමණු ඉටුකර ගැනීමට අදාල ක්‍රමවේදයන් ඇතුළත් කර පිළියෙල කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර් සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. එහෙයින් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අරමුණු හා තථ්‍ය ලඟාකර ගැනීම් පිළිබඳ නිසි ඇගයීමක් කළ නොහැකි විය.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වරින් වර දැනුම් දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම්